සුළු පාපයන් ගැන මම ඔබට අවවාද කරමි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව සහ්ල් ඉබ්නු සඃද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "සුළු පාපයන් ගැන මම ඔබට අවවාද කරමි. සැබැවින්ම සුළු පාපයන් වනාහි මිටියාවතක් මධ්යයේ ගොඩ බසින පිරිසක් මෙනි. ඇතැමුන් කෝටු සමග පැමිණෙයි. තවත් ඇතැමුන් ද කෝටු සමග පැමිණෙයි. අවසානයේ එමගින් ඔවුන්ගේ රොටි පිළියෙල කර ගනිති. සැබැවින්ම සුළු පාපයන් වනාහි, කවර අවස්ථාවක අදාළ පුද්ගලයා එමගින් ග්රහණය කරනු ලබන්නේ ද එය ඔහුව විනාශ කර දමනු ඇත."
[صحيح] [رواه أحمد]

කුඩා පාපයන් සිදු කිරීම සම්බන්ධව නොසැළකිලමත්කම ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අවවාද කළහ. එය වැඩි වී යයි. එවිට ඒ සියල්ලෙහි එකතුවෙන් ඔහුව විනාශ කර දමයි. ඒ සඳහා උපමාවක් ලෙස මිටියාවතක් මධ්යයේ ගොඩ බැස්ස පිරිසක් සඳහන් කළහ. ඔවුන් අතරින් සෑම කෙනෙකුම කුඩා කොටුවක් සමග පැමිණෙයි. අවසානයේ රැස් කරනු ලැබූ කෝටු එකතුවෙන් ඔවුහු ඔවුන්ගේ රොටි පිස ගනිති. සැබැවින්ම සුළු පාපයන් වනාහි, අදාළ තැනැත්තා ඒවා සිදු කර ඒ සඳහා පාපක්ෂමාවෙහි නිරත නොවූ යේ නම් හෝ අල්ලාහ් ඒ ගැන ඔහුට සමාව නොදුන්නේ නම්, ඒවා ඔහුව විනාශ කර දමනු ඇත.

http://sunnah.global/hadeeth/si/show/66224